සියලු ම හිමිකම් ඇවිරිණි./ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 2024

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා 2x20 = ලකුණු 40ක් හිමි වේ.
- ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01. රජය සම්බන්ධ නඩුවල දී අවශ්‍ය නීති උපදෙස් ලබා දෙනු ලබන්නේ ..................................... විසිනි.
(ශ්‍රේෂ්ඨාධිකරණය/නීතිපති දෙපාර්තමේන්තුව/අධිකරණය)

02. යම් ප්‍රතිපත්ති මලාවක් පදනම් කරගෙන ආණ්ඩු බලය ලබා ගැනීම සඳහා සංවිධානය වූ පුද්ගල කණ්ඩායම ............................... ලෙස හැඳින්වේ.
(ආණ්ඩුව/දේශපාලන පක්ෂ/බලපෑම් කණ්ඩායම්)

03. පළාත් පාලන ආයතන වල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පළාත් සභාවලට පවරා ඇත්තේ1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ ....................... සංශෝධනය මගිනි.
(13 වන/14 වන/ 15 වන)

04. "ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි" යන නිර්වචනය ඉදිරිපත් කර ඇති චින්තකයා වන්නේ ........................ ය.
(ඒබ්‍රහම් ලින්කන්/සීලර්/ගානර්)

05. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් ලෙස ................................. පෙන්වා දිය හැකිය.
(පුනරාවර්තනය/ප්‍රාරම්භනය/ජනමත විචාරණය)

- ප්‍රශ්ණ අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති වගන්ති හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. සමාජය යනු පුද්ගල හා සංවිධාන සමූහයක එකතුවකි ( )
07. "අලුත් අලුත් දැ නොතනන ජාතිය ලොව නොනගී" මෙය මහගම සේකර මහතා ඉදිරිපත් කර ඇති අදහසකි ( )
08. පළාත් පාලන ආයතන මධ්‍යම ආණ්ඩුව පනවන නියෝග පමණක් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී ( )
09. කොළඹ, ගාල්ල, මහනුවර මෙරට මුලින්ම ආරම්භ කළ මහ නගර සභා ත්‍රිත්වයයි. ( )
10. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ පුරවැසි සභාවයි ( )

• ප්‍රශ්ණ අංක 11-15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

11. "සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම" මෙම ආයතනයේ දැක්ම වේ.
   I බන්ධනාගාර දෙපාර්තමේන්තුව
   II රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
   III නීතිපති දෙපාර්තමේන්තුව
   IV ශ්‍රී ලංකා පොලිසිය

12. තාක්‍ෂණික වෙනස්වීම් සමඟ රටක ඇතිවන හිතකර බලපෑමකි.
   I ඵලදායීතාව වැඩිවීම
   II මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම
   III පරිසර දූෂණය
   IV මිනිසුන් යාන්ත්‍රීකරණය වීම

13. අප රටට පමණක් ආවේණික වූ දේශීය සතුන් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
   I නීල කොබෙයියා, වළි කුකුළා, අං කටුස්සා
   II වළි කුකුළා, කළු වදුරා, ගෝනා
   III පතිරණ සාලයා, වළි කුකුළා, අලියා
   IV මුවා, අං කටුස්සා, ගෝනා

14. ප්‍රාදේශීය අවශ්‍යතා වඩාත් ඵලදායීව හා කාර්යක්‍ෂමව ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ආයතන විශේෂය වන්නේ,
   I මහ නගර සභාව
   II මධ්‍යම ආණ්ඩුව
   III පළාත් සභා
   IV පළාත් පාලන ආයතන

15. තමා විසින්ම සකස් කරගත් ඇඳුම් භාවිතා කරමින් දේශීය නිෂ්පාදනවල අගය තම ජනතාවට අවබෝධ කර දුන් ඉන්දීය නායකයා වන්නේ,
   I අබ්දුල් කලාම්
   II ජවහල්ලාල් නේරු
   III රාජේන්ද්‍ර පටේල්
   IV මහත්මා ගාන්ධි

• අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට "අ" කොටසට ගැලපෙන පිළිතුර "ආ" කොටසින් තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන තුළ යොදන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 16. රටක ක්‍රියාත්මක වන උත්තරීතර නීතිය | (..............) | A දේශීය නීතිය |
| 17. සමූපකාර ව්‍යාපාරයේ පියා | (..............) | B ආචාර ධර්ම |
| 18. "ඔබ කුමක් කළත් හොඳ කෙනෙක් වන්න" මෙය මොහුගේ ප්‍රසිද්ධ කියමනකි. | (..............) | C ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය |
| 19. රටක් තම දේශසීමාව තුළ ක්‍රියාත්මක වන පරිදි පනවන නීතිය | (..............) | D රොබට් ඕවන් |
| 20. සෑම සමාජයකටම ආවේණික වූ, සෑම සමාජයකටම පොදු ලක්‍ෂණයකි. | (..............) | E ඒබ්‍රහම් ලින්කන් |

(ලකුණු 20x2 = 40)


II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

1. I නීතියේ මූලාශ්‍ර 02ක් ලියන්න.
   II ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන 02ක් සඳහන් කරන්න.
   III ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප 02 සඳහන් කරන්න.
   IV බහු පක්ෂ ක්‍රමය පවතින රටවල් 02ක් නම් කරන්න.
   V පාසල් සමූපකාර සමිතියේ පාසල් දරුවන්ට ලබා ගත හැකි සේවා 02ක් සඳහන් කරන්න.
   VI පළාත් පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාර 02ක් සඳහන් කරන්න.
   VII ඔබගේ පාසල අයත් පළාත තුළ පිහිටි දිස්ත්‍රික්ක 02ක් නම් කරන්න.
   VIII එක් එක් ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ප්‍රාදේශීය අවශ්‍යතා විවිධ වීමට බලපා ඇති හේතු 02ක් ලියන්න.

(ල 2x8 = 16)

2. I සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දායකවන ආයතන රාශියක් සමාජයේ දක්නට ලැබේ. ඒ ඇසුරින් පහත රූප සටහන සම්පූර්ණ කරන්න. (ල 2)




   II සමාජ සුරක්ෂිතතාව සඳහා ඉන් එක් ආයතනයකින් ඉටුවන කාර්යයන් 04ක් ලියන්න. (ල 4)
   III සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා දායකවන ආයතන කිහිපයක් I තීරුවේ සඳහන් වේ. එම ආයතන ඉටුකරන කාර්යයන් II තීරුවේ සඳහන් වේ. ඒවා නිවැරදි පරිදි යා කරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| A අධිකරණය | • ජනතාව අතර ඇතිවන සුළු ආරවුල් විසඳීම |
| B ශ්‍රී ලංකා පොලිසිය | • නීතිය හා සාමය ආරක්ෂා කිරීම |
| C සමථමණ්ඩලය | • යුක්තිය පසිඳලීම |
| D නීතිපති දෙපාර්තමේන්තුව | • 1929 කෙටි දුරකථන අංකය පවත්වාගෙන යාම |
| E ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | • රජය සම්බන්ධ හෝ රජයට එරෙහි සියලුම නීති කාර්ය ගොනු කිරීම |

(ල 5)

3. I තාක්ෂණික වෙනස්වීම් යනු කුමක්දැයි සරලව නිර්වචනය කරන්න. (ල 2)
   II තාක්ෂණික වෙනස්වීම් සමඟ සමාජයේ ඇති වී තිබෙන වෙනස්කම් 02ක් ලියන්න. (ල 2)
   III ඕනෑම රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි 03කි. ඒ මොනවාදැයි නම් කරන්න. (ල 3)
   IV තාක්ෂණයේ වෙනස් වීම් සමඟ කෘෂිකාර්මික හා කාර්මික ක්ෂේත්‍රවල සිදු වී ඇති වෙනස්කම් 02 බැගින් සඳහන් කරන්න.

කෘෂිකාර්මික ක්ෂේත්‍රය :- A ................................
B ................................

කාර්මික ක්ෂේත්‍රය :- C ................................
D ................................ (ල 4)

4. I A රූපයෙන් ඔබට පෙනෙන යහජීවන ගුණාංග 03 ක් ලියන්න.



A ................................

B ................................

C ................................

(ල 3)

II යහජීවන ගුණාංග පුරුදු පුහුණු නොකිරීමෙන් මුහුණ දීමට සිදුවන අයහපත් ප්‍රතිඵල 03ක් සඳහන් කරන්න. (ල 3)

III සහජීවන ගුණාංග ජීවිතයට අදාළ කර ගැනීමෙන් අත්වන වාසි 03ක් ලියන්න. (ල 3)

IV ඔබ ජීවත්වන ඔබගේ පවුල් ඒකකය තුළින් සහජීවන ගුණාංග විදහා දැක්වුණු අවස්ථා 02ක් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න (ල 2)

5. I ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වීමට බලපාන හේතු 03ක් ලියන්න. (ල 3)

II ප්‍රජාතනත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ 04 ක් සඳහන් කරන්න (ල 4)

III "අයිතිවාසිකම් හා යුතුකම් එකම කාසියක දෙපැත්ත මෙන් එකට බැඳී පවතී"

පහත වගුව තුළ දක්වා ඇති අයිතිවාසිකම් වෙනුවෙන් පුරවැසියකු වශයෙන් අපෙන් සමාජයට ඉටුවිය යුතු යුතුකම් මොනවාදැයි ලියා දක්වන්න.

| අයිතිවාසිකම | යුතුකම |
|---|---|
| අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය | A .............................. |
| තමන් කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය | B .............................. |
| රැකියාවක් කිරීමට ඇති අයිතිය | C .............................. |
| ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය | D .............................. |

(ල 4)

6. I නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල්වල ජනතා නියෝජිතයන් තෝරා පත්කර ගැනීම සඳහා භාවිතා කරන ප්‍රධාන නියෝජන ක්‍රම 02 නම් කරන්න. (ල 2)

II ලාංකිකයන්ට සීමිත ඡන්ද බලය හිමි වූ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ 02 පිළිවෙළින් සඳහන් කරන්න. (ල 2)

III ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ 03 ක් ලියන්න. (ල 3)

IV මැතිවරණ හා සම්බන්ධ පුරවැසි යුතුකම් 04ක් සඳහන් කරන්න. (ල 4)

7. I පළාත් පාලන ආයතන යනු මොනවාදැයි සරලව නිර්වචනය කරන්න. (ල 2)

II වර්තමානයේ මෙරට ක්‍රියාත්මකවන පළාත් පාලන ආයතන වර්ග 03 සඳහන් කරන්න. (ල 3)

III පළාත් පාලන ආයතනවල අවශ්‍යතාවය දැක්වෙන පහත රූප සටහන සම්පූර්ණ කරන්න. (ල 3)




(ල 3)

IV පළාත් පාලන ආයතනවලින් ඉටු කෙරෙන සේවා සම්බන්ධයෙන් මහජනතාවගෙන් ඉටුවිය යුතු යුතුකම් 03 ක් සඳහන් කරන්න. (ල 3)

සියලු ම හිමිකම් ඇවිරිණි./ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 2024

## පුරවැසි අධ්‍යාපනය

පිළිතුරු පත්‍රය

I කොටස

| | | | |
|---|---|---|---|
| 01. නීතිපති දෙපාතමේන්තුව | 06. √ | 11. II රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ | 16. E |
| 02. දේශපාලන පක්ෂ | 07. X | 12. I ඵලදායිතාව වැඩිවීම | 17. D |
| 03. 13 වන | 08. X | 13. I නීල කොබෙයියා, වළි කුකුළා, අං කටුස්සා | 18. A |
| 04. සීලර් | 09. √ | 14. IV පළාත් පාලන ආයතන | 19. B |
| 05. ජනමතවිචාරණය | 10. √ | 15. IV මහත්මා ගාන්ධි | 20. C |

(ල 2x20 = 40)

II කොටස

1. I * ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව * අධිකරණ තීරණ (පිටුව 11)
   II * ශ්‍රේෂ්ඨාධිකරණය * අභියාචනාධිකරණය (පිටුව 13)
   III * ඍජු ප්‍රජාතන්ත්‍රවාදය * වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය (නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය)
   IV * ශ්‍රී ලංකාව, ඉන්දියාව
   V * පාසල් ලිපි ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම * ආහාර ද්‍රව්‍ය පහසු මිලට ලබා ගැනීම (පිටු 58)
   VI * වරිපණම්/බදු මුදල් * පොදු සේවා සැපයීමෙන් ලැබෙන ආදායම් (පිදුම 99)
   VII * කුරුණෑගල * පුත්තලම
   VIII* සම්පත්වල ව්‍යාප්තිය * සංස්කෘතික විවිධත්වය
   * භූගෝලීය පසුබිම (ල 2x08 = 16)

2. I * පාසල * සමාජ ආයතන (ල 2)
   II නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල 4)
   III A යුක්තිය පසිඳලීම B නීතිය හා සාමය ආරක්ෂා කිරීම
   C ජනතාව අතර ඇතිවන සුළු ආරවුල් විසඳීම
   D රජය සම්බන්ධ හෝ රජයට එරෙහි සියලුම නීති කාර්ය ගොනු කිරීම
   E 1929 කෙටි දුරකථන අංකය පවත්වාගෙන යාම (ල 05)

3. I * මිනිස් අවශ්‍යතා පහසු කර ගැනීම සඳහා යොදා ගනු ලබන ක්‍රමවේද වල ඇති කරන වෙනස්කම් තාක්ෂණික වෙනස්කම් ලෙස හැඳින්වේ.
   II * මිනිසාගේ පරිභෝජන රටාව වෙනස් වීම
   * නව රැකියා රැසක් බිහි වීම (පිටුව 29) (ල 02)
   III * නිෂ්පාදනය * බෙදාහැරීම * පාරිභෝජනය (ල 03)
   IV කෘෂිකාර්මික :- * රසායනික පොහොර හා පළිබෝධනාශක භාවිතය
   * ජාන තාක්ෂණය (පිටුව 33)
   කාර්මික :- * ශ්‍රම විභජනය හා විශේෂිකරණය
   * එකලස් කිරීමේ කර්මාන්ත බිහිවීම (පිටුව 35) (ල 04)

4. I * පරිත්‍යාගශීලී බව * උත්සාහවන්ත බව
   * පරිසරයට ආදරය කිරීම (පිටුව 47) (නිවැරදි පිළිතුරු සඳහා ලකකුණු ලබා දෙන්න.) (ල 03)

II * මිනිසාගේ ජීවිත කාලය අවාසනාවන්ත ලෙස ගෙවී යාම
* ස්වාභාවික සම්පත් විනාශ වීම
* සමාජ සුරක්ෂිතතාව බිඳ වැටීම (පිටුව 48) (ල 03)

III * පුද්ගල සංවර්ධනය සිදු වීම
* සාමය ස්ථාපිත වීම
* අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම (පිටුව 52) (ල 03)

IV * අඟ හිඟකම් ඇති පවුල් ඒකකයකට ආහාර ද්‍රව්‍ය ආදිය ලබාදීම.
* අසල්වැසි නිවසක අවමංගල්‍ය අවස්ථාවක දී ඔවුන්ට උදවු උපකාර කිරීම
නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න (ල 02)

5. I * යුතුකම් ඉටුකරමින් අයිතිවාසිකම් භුක්ති විඳීම.
* අන්මත ගරු කිරීම
* සාමානාත්මතාවට ගරු කිරීම (පිටුව 68) (ල 03)

II * නීතියේ ආධිපත්‍ය
* බහුතර කැමැත්ත මත තීරණ ගැනීම (පිටුව 71) (ල 04)

III අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
* හොඳින් අධ්‍යාපනය ලැබීම
* ගුරුවරුන්ට ගරු කිරීම.

තමන් කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය
* අන්‍ය ආගම්වලට අපහාස වන දෑ ප්‍රකාශ නොකිරීම
* පූජ්‍ය/පූජක උතුමන්ට ගරු කිරීම

රැකියාවක් කිරීමට ඇති අයිතිය
* නීත්‍යානුකූල රැකියාවන නිරතවීම
* සේවා අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කිරීම

ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය
* මැතිවරණ නීතිරීතිවලට අවනත වීම
* ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැළකීම
(නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න) (ල 04)

6. I * සරල බහුතර නියෝජන ක්‍රමය
* සමානුපාතික නියෝජන ක්‍රමය (ල 02)

II 1910 - කෲ මැකලම්
1931 - ඩොනමෝර් (ල 2)

III * ජනාධිපතිවරණය
* පාර්ලිමේන්තු මැතිවරණය (පිටුව 80) (ල 03)

IV පිටුව 83 (ල 04)

7 I ප්‍රජා සේවා පහසුවෙන් හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ආයතන විශේෂය, පළාත් පාලන ආවතන වේ. (ල 02)

II ප්‍රාදේශීය සභා
නගර සභා
මහ නගර සභා (ල 03)

III (92 පිටුව) (ල 03)

IV කලට වේලාවට නියමිත බදු ගෙවීම
සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම. (පිටුව 105) (ල 03)